නිපුණතා මට්ටම:- 9.2 සංගීත අධ්‍යයනයේ නිර්මාණයේ සහ සංරක්ෂණයේ දී පරිගණක සංගීතය පිළිබඳ අවබෝධය ලබමින් ප්‍රායෝගික අත්හදාබැලීම් වල යෙදෙයි.

Playing , Recording music with computer

⋆ පහත කියවීම් පත්‍රිකාවේ සඳහන් ක්‍රියාකාරකම් පියවරෙන් පියවර සිදු කරන්න.

මෙම ක්‍රියාකාරකම සඳහා ඔබට පරිගණක භාවිතය ගැන සාමාන්‍ය දැනුමක් තිබිය යුතු අතර නොමැති නම් දැනුමක් සහිත අයකුගේ සහයෝගය ලබා ගත යුතු ය. පරිගණකයක්/ මයික්‍රපෝනය සහිත හෙඩ්පෝන් එකක් අවම පහසුකම් ලෙස තිබිය යුතු ය. Laptop එකක් නම් එහි ස්ථාපිත මයික්‍රපෝනය ද භාවිතා කළ හැකිය.

පරිගණකය ON කර > All Program > Accessories > Sound Recorder මෘදුකාංගයේ start Recording මගින් පළමු ව ගීතයක් ගයමින් හෝ වයමින් මෙම ක්‍රියාකාරකම ආරම්භ කරන්න. එය save කර නැවත play කරන්න.



නැවත නැවත වෙනත් ගීත ද ගයා වයා Record කර අසා රස විඳින්න. අපැහැදිළි හඬක් ඇසේ නම් start > control panel > sound > Recording > microphone වෙත ගොස් volume leval 20 -10 දක්වා අඩු කරමින් Record කර බලන්න. ඔබ හෙඩ්පෝන් එකක් භාවිතා කරයි නම් එය නිවැරදි ලෙස පරිගණකයට සම්බන්ධ කර තිබිය යුතු ය.

මෙම මෘදුකාංගය ද ඔබට Recording සඳහා භාවිතා කළ හැකි සරළ මෘදුකාංගයක් වන අතර අන්තර්ජාලය භාවිතයෙන් බාගත කළ හැකිය. එය ද අත්හදා බලන්න.

අන්තර්ජාලය භාවිතයෙන් MIDI Piano මෘදුකාංගයක් බාගත කර ස්ථාපනය කර ගැනීමෙන් පරිගණකයේ යතුරු පුවරුව භාවිතා කරමින් ස්වර වාදනය හා රෙකෝඩ් කර බලන්න. ගීත වාදනය කිරීම රෙකෝඩ් කිරීම හා නැවත එය ශ්‍රවනය කිරීම සිදුකර බලන්න.

- ❖ වැඩි පහසුකම් හා සංකීර්ණ ක්‍රියාකාරකම් සහිත **Playing and Recording software** රාශියක් නිර්මාණය කර ඇති අතර අන්තර්ජාලය භාවිතයෙන් ඒ පිළිබඳ වැඩිදුරටත් අධ්‍යයනය කරන්න. උදා (Nuendo / Cubase / FL Studio / Pro Tools / Adobe Audition / Cakewalk / Music Creator / Reason)

ᏥᎦ :-